27 . 07 . 2016

| 13 ශ්‍රේණිය | සිංහල භාෂාව හා සාහිත්‍යය - 2016 | කාලය : පැ. 3 යි |
|---|---|---|

නම :- 12 ත්‍රෛවාර්ෂ 2016 ................................ විභාග අංකය :- ....................

Learning Resource Center De Mazenod College Kandana

## I කොටස

● පළමු වන ප්‍රශ්නය ඇතුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න.

01. (අ) පහත දැක්වෙන උද්ධෘත ඇසුරෙන් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(1) මේ සත් අවුරුදු සත් මස් සත් දවසකින් සඳවිල සමීපයට ගොස් බෝධිසත්ත්වයක් වසන එක් පෙදෙසක් නිම කොට මෙතැන් වලක් ගසා ඇත් රජුහු විද ජීවිත විනාශයට පමුණුවා දළ කපා ගනිමියි රජහු මෙතෙක් දවස් ගොස් සිටිනා තැන උදැල්ලකින් සිවුරක් කොට බිඳ කැන කැනිපස් බිජුවට හිස්නාක් මෙන් දියෙහි ඉසුරුවා වෙහෙි වනු වල ඔබ්බා ටැම් සිටුවා දැව මත ඔබ්බා තුලාම් අතුට එහි පෝරු වතගසා මධ්‍යයෙහි හි දණ්ඩක් යවා විතර සිදුරක් කොට අවකාශස්ථානයෙහි වැලි පස් කසල ආදිය නෙදනෙනා පරිද්දෙන් පෝරුමත්තෙහි වසා තබා යන විතර මඟක් ඉවතින් තබා පෙර පරිද්දෙන් වළ නිමි කල්හි උදෑ සනක් සේම ඉස තොප්පියක් බහා කසා කඩක් පෙරව විෂ සැර හා දෑඩි දුන්නක් ගෙනා වළට බැස සිටියේ ය.

(i) මෙහි සඳහන් තැනැත්තා සඳවිල සමීපයට ගියේ ඇයි?
(ii) වළෙන් ගන්නා ලද පස්වලට කුමක් කළේද?
(iii) ටැම්පෝරු ආදී සම්භාර යන්නෙහි අර්ථය දක්වන්න.
(iv) වළ ඇතුළට බැස තබා ගත් ආයුධ නම් කරන්න. (ල. 04)

(2) ඉක්බිත්තෝ ඇමෙණියෝ හැඳ බඩට ගොසින් පිට පිරිමැද පියා 'ඇඟට නුසුව කුමක්දැයි'' විචාළහ. මට කිසිත් අථාසුවක් නැහැයි කී කල්හි රජ්ජුරුවන් වහන්සේගෙන් උදහස් වූ නියා දැයි විචාර එසේත් නැතැයි කී කල්හි දූ දරුවන් ගෙන් හෝ ගෙයි කෙළි - කොල්ලන්ගෙන් මුසුප්පු වන්නට තිස්සක් කළ නියාදැයි විචාර, එසේ නැතැයි කී කල්හි ගෙය දඩ විචාරීමෙහි කුසි කමක් නැත්තා සේම විචාරීමෙහි නුකුසීතව එසේ කල කිසිදෙයක් කන්ට රුචි ඇති නියා දැයි විචාළහ. එසේ වුවත් වස්තුව අගිදම් වෙයි යන හයින් කිසිවකුත් නොකියාම වැද හොත්හ. ඉක්බිතියෙන් සිටු දියණියෝ, මට කියන දෙයට මැළි වන්නේ හැයිද? නිව මැනව යි කරයේ කිවුහ. එවේලේ දී රළු දෙයක් සපා දුකසේ ගලන පරිදදෙන්, කිසිවක් කන්ට ආලයෙන් ඇතැයි කිවුහ. කුමකට දැයි විචා කල්හි සිත හා උනුන් ගෙන කබලු දුවකට යැයි නැතක් වේලකින් කෙසිවිදට මහත් දෙයක් කෙසිවිදකින් අදහා කල්ක් පරිද්දෙන් දුකසේ කියාපීහ.

(i) බිරිය ඇඳ ළඟට ගොස් විමසන පළමු ප්‍රශ්නය කුමක්ද?
(ii) සිටුතුමා බිරිය අසන ප්‍රශ්නවලට පිළිතුරු නොදී සිටියේ ඇයි?
(iii) සිතේ ඇති ආශාව සිටුවරයා දුකසේ ප්‍රකාශ කළ අයුරු කියවෙන උපමාව ඔබේ බසින් ලියන්න.
(iv) ''ගෙයි දඩ විචාරීමෙහි කුසී කමක් නැත්තා සේ'' යන්නෙහි අර්ථය දක්වන්න.

(ල. 04)

(3) මුළු දුවණියන් හෙයින් මුඹට කියන කරන දෙයක් නැතැත් මා අයති (අයිති) හෙයින් කළ අපරාධ තරමට මරවාපියන සේක්. මා ඔබ යන්නට බැරියයි කීහ. සිටු දියණියෝ තවත් තවත් කියාත් උක් මැළි හෙයින් උන් කර්මාන්තයට ගියදී ඉක්බිති ගෙවල ඇත්තවුන්ට ඉදින් අවුත් මා නොදක විචාළෝ නම් දෙමව්පියන්ගේ ඔබ මා ගිය නියාව කියාලුව මැනැවැයි කියාලා ගෙයි දොර පියා නික්මුනාවුය. උයිත් අවුදින් සිටු දුවණියන් නොදක ඉන්බිති ගෙවල ඇත්තවුන් විචාරා එපවත් අසා රඳවන්නට යයි ලුහුබඳවා ගොසින් දක

නොයෙක් ලෙස යාච්ඥා කොට රඳවාපියා නුහුණුවය. යන ගමනේ දී එක් තැනකදී විළි පහරන්නට ඌ එක් කැලැහස්සකට වැදලා සමණනුන් එතැන දක්වා ගිය හෙයින් විළි පහරනා නියාව කියාලා ප්‍ර වේදනාව බලවත් හෙයින් ගැසි මැසි දුකින් පුතණු කෙනෙකුන් වදාපියා යම් කයයුත්තෙක, දෙමාපියන ළඟට යාමෝ නම් ඒ සමෘද්ධ වී යයි නැවතත් රඳාහුන් තැනට ගොසික් රඳාහුන්හ.

(i) සිටු දියණියට දෙමාපියන් මතක් වුයේ ඇයි?
(ii) පුරුෂයා බියවීමට හේතුව කුමක්ද?
(iii) දියණියක් වශයෙන් මින් ලබාගත මැකි උපදේශය කුමක්ද?
(iv) කලෑහස්සකට, විළිපහරන්නට යන වචනවල අර්ථ සපයන්න. (ල. 04)

(ඊ) (i) නිතොර රඳුන සුදු රස් ලෙස මුනි පුදට
නොහැර බැබළි මළු පැහැසර සතර ජිව
පැතිර ඇඹැර කඳු ගෙනැ සිටි මෙන් අවට
මිතුර උදුළ මහවුර දුටු වෙයි සතුට

ගුවන් කුසැ පැතිරි රන් කැරැලි මිණි රැසේ
පවන් වැද ලෙළෙන දද මිණි කිකිණි ගොසේ
ලෙවන් සතුටු කළ හිමගිරි කුළෙක ලෙසේ
සවන් මැඳුර බල දිලිහෙන ඉඳුරු දෙසේ

i. තොටගමු වෙහෙර වටා ඇති ප්‍රාකාරය කවියා දකින්නේ කෙසේ ද?
ii. "සඳ" යන්නෙන් පළමු කවියේ දෙන අරුතට වඩා වෙනත් අරුතක් දෙන වාක්‍යයක් තනන්න.
iii. "සවන් මැඳුර", "ඉඳුරු දෙසේ" යන පදවලට සමාන පද ලියන්න.
iv. මෙහි සතුටට පත්වන්නේ කවුරු ද? ඊට හේතුව කුමක් ද?

(ii) පහත සඳහන් උද්ධෘත අතුරෙන් හතරක අවස්ථා සම්බන්ධය ලියන්න.

i) තාත්තා නැතිවුනාට පස්සේ ගෙදර නැවතුනා.
ii) ඇයි මෙච්චරක් කියන්නට මැලිවුයේ අසුකෙළක් වස්තු ඇත්වන් දුක්පත් හෙයින්ද ?
iii) දැන් මේ රාජ්‍යයට පැමිණ කවර කාරණාවෙකින් සුදු මැලිව ශරීර ඇතිව දුර්වලව ගියාද ?
iv) මේ ගොල්ලන්ගේ තකහනියට පුළුවන්ද ලෙඩ හොඳ කරන්න.
v) එම්බල චණ්ඩාල කෙල්ල මගේ ගෙය කුමක් පිණිස දූෂ්‍ය කෙරෙයිදී

(උ) පහත සඳහන් කවි පංතිය පිලිබඳ රසාස්වාදයක් ලියන්න.

රන් හැට්ටය හැඳ
රන් පටියෙහි
දින කඩුව බැඳ
අසුපිට නැගුණු කුමාරයා
ගම් නියම් ගම් රාජධානි
පසුකොට ගියෝය.
පස් වසක් ගමන් කළ ඔහු
විවාහ කොටගත් කුමරිය
ගෙන ඒමට
තව පස්වසක් ගතවිය.
එ වැනි රුවක් නොදිටිමුයි
අඳ ගෙනා දින
පුර වැස්සෝ කීහ
එදින සවස් කල
පුර දොර අසලදී
රජ ගෙදර
දොරටු අසලදී
රජ ගෙදර
දොරටු පල්ලාගේ දුව
හඳා
කුමරටැ හමුවිය.
"තී කවුරු දැයි"
ඔහු විශ්මයෙන් ඇසීය
තීගේ වැනි රුවන්
මම කිසි කල නොදිටිමි.

27.07.2016
සිංහල
12 - තෙවන වාරය

02) සදධර්මරත්නාවලී කතුවරයා හාසයෙන් සහ උපහාසයෙන් මානව චරිත දෙස යොමු කරන දෘෂ්ටිය නිදසුන් දෙමින් විමසන්න.

<u>නැතහොත්</u>

ජාතක පොත වූ කලි තත්කාලින දේශපානික සමාජ ආර්ථික සහ සංස්කෘතික තොරතුරු හෙළිකරන කෘතියකි. නිදසුන් දෙමින් මෙම අදහස විස්තර කරන්න.

03) අවස්ථා හා සිද්ධි වර්ණනවේදී වුවද ස්වාධීන මඟක් ගනිමින් ශ්‍රාවක පාඨක සිත් ඇදගන්නා පරිදි කරුණු ඉදිරිපත් කිරීම සද්ධර්මාලංකාර කතුවරයාගේ කථා ශෛලියේහි විශේෂ ලක්ෂණයකි නිදසුන් දෙමින් විස්තර කරන්න.

04) නූතන කවියා සම්ප්‍රදායික වස්තු විෂයෙන් බැහැරව නව අනුභූතියක් තෝරාගැනීමට දරණ උත්සහය නිදසුන් දෙමින් විස්තර කරන්.

05) මළගිය ඇත්තෝ නවකතාවෙන් නිරූපණය වන්නෙ සංස්කෘතින් දෙකක් අතර ඇතිවන ගැටුමකි නිදසුන් දෙමින් විස්තර කරන්න.

06) සමකාලීන දේශපාලන සමාජ විෂමතාව සහ ආධ්‍යාත්මික බිඳ වැටීම් කෙටි කතාවට වෘස්තු විෂය කරගෙන ඇති ආකාරය නිදසුන් දෙමින් විස්තර කරන්න.

07) ගිරා සන්දේශ කතුවරයාට ආවේණික ස්වාධින ලක්ෂණයක් තෝරාගෙන එම ලක්ෂණය අභිමත වර්ණනා දෙකක් ආශ්‍රයෙන් විස්තර කරන්න.

<u>නැතහොත්</u>

ගිරා සන්දේශ කතුවරයාගේ වර්ණන චාතුර්ය වර්ණනා දෙකක් ආශ්‍රයෙන් පැහැදිලි කරන්න.

08) රත්නාවලි නාටිකාවේ පිළිබිඹුවන නාට්‍යමය ලක්ෂණ නිදසුන් දෙමින් විස්තර කරන්න.

Learning Resource Center
R
De Mazenod College
Kandana